පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

1.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාර්ලිමේන්තු පනත් -----------------------			
	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,184,708,986 ක අතිරික්ත මුදල් ආයෝජනය කර තිබුණි.	මුදල් අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ හැර පෙර වර්ෂයේ අත්‍යවශ ලිපි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මහ භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව.	පනත අනුව කටයුතු කළ යුතුය.
(ආ)	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ VII කොටසේ 45(2) XV වගන්තිය	ජාතික පර්යේෂණ සභාවෙන් 2015 වර්ෂයේදී ව්‍යාපෘතියක් සඳහා ලැබී තිබුණු රු.15,169,843 ක පර්යේෂණ ප්‍රදානය වෙනුවෙන් පාලක සභාවේ අනුමැතිය යටතේ උපකුලපතිවරයා විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව මහාචාර්යවරයෙකු විසින් ගිවිසුම අත්සන් කර එම ප්‍රදානය පෞද්ගලික ගිණුමකට බැර කර තිබුණි. එසේම එම පර්යේෂණය මඟින් 2020 ජනවාරි 01 සිට 2023 ජුනි 02 දක්වා කාලය තුළ නිපදවන ලද පිලිකා නාශක කැප්සියුලය අලෙවි කිරීම තුලින් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු.351,316ක දායකය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අලෙවි ආදායමෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු පුරස්කාර වටිනාකම මහාචාර්යවරයාගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව.	අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේI කොටසෙහි V වන පරිච්ඡේදයෙහි 4.1 ඡේදය හා 4.1.1 ඡේදය	ආචාර්යවරයෙකු විසින් තම සේවයෙන් ඉල්ලා අස් වීම මාස 03 කට පෙර නියමිත කාර්යය පරිපාටිය යටතේ පාලක සභාවට ලිඛිතව දැන්විය යුතු බවත්, මාස 03 කට පෙර දැනුම් නොදෙන්නේ නම් මාස 03ක වැටුප විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බව දක්වා ඇතත් කථිකාචාර්යවරුන් 40 දෙනෙකු සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කළ දිනයේ සිටම සේවයට වාර්තා කර නොතිබුණද ඔවුන්ගෙන් අයකළ යුතු රු.9,212,748 ක් වූ මාස 03 ක වැටුප් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xix වන පරිච්ඡේදයේ 5 ඡේදය	ආයතන සංග්‍රහයේ නියමයන්ගෙන් බැහැරව විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කරන ලද කුලී මුදලක් අය කිරීම හේතුවෙන් 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා අධ්‍යයන හා අනධ්‍යාන කාර්ය මණ්ඩලයේ 324 දෙනෙකුගෙන් එකතුව රු.19,680,784ක කුලී මුදලක් අඩුවෙන් අයකර තිබුණි.	2024 ඔක්තෝබර් 01 දින සිට සංශෝධිත නිල නිවාස කුලිය අය කරන ලෙස මූල්‍යාධිකාරි වෙත දැනුම් දී ඇති බව.	ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2),(3)	ඉදිකිරීම් ව්‍යාපෘති අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇති ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.33,429,836 ක රඳවුම් ගාස්තු හා රු.3,531,810 ක් වූ ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති 02 කට අදාල රු. 3,498,874 ක මුදලක් නිදහස් කර ඇති අතර ඉංජිනේරු නිර්දේශය හා කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත මුදල් නිදහස් කරන බව හා තැන්පතු ඉල්ලීම් කර නොමැති බැවින් මුදල් කමිටු අනුමැතිය මත ආදායමට ගෙන ඇති බව.	අදාල මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

(ඊ)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන වගන්තිය	වාහන ඉවත් කිරීමේ ක්‍රියාවලිය මඟින් ලද රු. 3,304,899 ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකර විශ්වවිද්‍යාල ගිණුමට බැර කර තිබුණි.	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII කොටසේ 99(1) (ඇ) වගන්තියට අනුව විශ්වවිද්‍යාල අරමුදලට බැර කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය.
(උ)	2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5.1.2 ඡේදය	2016 සිට 2024 ජූලි දක්වා කාලය තුළ ක්‍රියාත්මකව පැවතුණු එකතු ආදායම රු.456,251,500 ක ආදායමක් සහිත ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 40 කින් දේශන ශාලා, රසායනාගාර හා අනිකුත් පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත කිසිදු දායකත්වයක් නොගෙවා විශ්වවිද්‍යාල අරමුදලෙහි රඳවා තිබුණි.	04/2016 චක්‍රලේඛ නිර්දේශයන් නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර මෙම චක්‍රලේඛය සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතින බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඌ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන ආයතනික චක්‍රලේඛ ලිපිය	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ස්ථිර හා ආධුනික කථිකාචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව 2023 වර්ෂයේදී රු.3,385,317,098ක් හා 2024 වර්ෂයේදී රු.3,711,517,359ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	අධ්‍යයන කාර්ය මණ්ඩලයට පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරන බව හා තාවකාලික කථිකාචාර්යවරුන් පැමිණීම හා පිටවීම පොතක සටහන් කරන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කිරීමෙන් පසු පමණක් වැටුප් ගෙවන බව.	චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(එ)	2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ රු.71,061,240 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.	15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර ඇති බව.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඒ)	2015 මැයි 07 දිනැති අංක UGC/AC/QA/Gen දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්	විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු වසරකට අවම පැය 300ක කාලයක් සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ද (Student Contact Hours) ඉතිරි පැය	පිළිතුර ලබා දී නොමැත.	මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කළ යුතුය.

සභාවේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන ආචාරධර්ම සහ අධ්‍යයන වගවීමේ මාර්ගෝපදේශය	1100ක කාලය පර්යේෂණ, විශ්වවිද්‍යාල හා ජාතික සංවර්ධනයට අදාළ වන කාර්යයන්හිද සති 12 ක කාල සීමාව විභාග කටයුතු, ප්‍රශ්න පත්‍ර පරීක්ෂාව සඳහා වෙන්කළ යුතු වුවද මහාචාර්යවරියක විසින් 2023 ජනවාරි 01 දින සිට 2024 ජූනි 30 දින දක්වා අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ පැය 10ක් පමණක් දේශන පවත්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.587,618,865 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 177,927,611 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.409,691,254 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෞද්ගලික පඩිනඩි වියදම්, නඩත්තු වියදම් ,අධ්‍යයන කටයුතු සඳහා මූල්‍ය සහයක වියදම් හා වෙනත් පුනරාවර්තන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 සිට 2024 කාලපරිච්ඡේදය තුළදී උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් ශිෂ්‍යත්ව ප්‍රදානයන් ලබාගෙන විදේශගතවූ කථිකාචාර්යවරු 07 දෙනෙකුගෙන් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් රු.53,414,966 ක් අය විය යුතුව පැවතුණි. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 68 දෙනෙකුගෙන් වසර 11 සිට 42ක කාලයක් බැඳුම්කර කඩවීම හේතුවෙන් අය නොවී පවතින රු.33,708,966 ක ශේෂයක් නියමිත කාලය තුළදී අයකර ගැනීමට උත්සාහ නොකිරීම නිසා තවදුරටත් අයවිය යුතු ලෙස පැවති අතර එම බැඳුම්කරලාභීන් හෝ ඔවුන්ගේ ඇපකරුවන් සොයා ගැනීමට අපොහොසත්වී තිබුණි.	ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු බැඳුම්කර මුදල් වහාම විශ්ව විද්‍යාලයට ගෙවන ලෙස දැනුම් දී ඇත.හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කර ඇති බව.	හිඟ මුදල් කඩිනමින් අයකළ යුතුය

(ආ)	2018 වර්ෂයේ සිට 2024 දක්වා කාලය තුළ අවසන් කළ යුතු විශ්වවිද්‍යාලයේ පීඨ 07ක ක්‍රියාත්මක එකතු වටිනාකම රු.97,760,741ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 46 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.86,049,868 ක වියදමක් දරා තිබුණු අතර එම පර්යේෂණ අවසන් කිරීමට හෝ එම ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	පර්යේෂණ සඳහා වියදම් වී ඇති මුදල් අදාල ආචාර්යවරුන්ගෙන් 2025.08.31 දිනට වාරික වශයෙන් සම්පූර්ණයෙන්ම අයකර අවසන් කරනු ලබන බව	පර්යේෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය
(ඇ)	අනධ්‍යයන සේවක වැඩ වර්ජනය සිදුකරන ලද 2024 මැයි 02 සිට 2024 ජූලි 15 දක්වා කාලසීමාව තුළදී ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 09 දෙනෙකු සඳහා හා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් 21ක් සඳහා ගෙවන ලද එකතුව රු.3,436,320ක් වූ වැටුප් අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.	අදාල නිලධාරින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව	කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2017 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අනුව එහි අනුමත නොවූ අධ්‍යක්ෂක තනතුරු 04 ක් සඳහා 2014 සිට 2024 වසර දක්වා එකතුව රු.3,222,972ක් දීමනා ලෙස ගෙවා තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාල පාලක සභාව මඟින් අනුමත දීමනා ප්‍රතිශතයන්ට අදාලව ගෙවීම් සිදු කර ඇති බව	අනුමත නොවූ තනතුරු සඳහා ගෙවා ඇති අධ්‍යක්ෂක දීමනා නැවත අය කළ යුතුය.
(ඉ)	විශ්වවිද්‍යාලයේ අපජල පද්ධතිය මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියට සම්බන්ධ කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මහනුවර මහනගර සභාව අතර අවබෝධතා ගිවිසුමට එළඹීමකින් තොරව 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භකළ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2020 වර්ෂයේ අවස්ථා 2 කදී රු.16,850,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. විගණන දිනය වූ 2024 ඔක්තෝම්බර් 28 දින වන විට භෞතික ප්‍රගතිය සියයට 7.8ක් වැනි අඩු මට්ටමක පැවති අතර 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ වැඩ නතර කර දමා තිබුණි.	මැනුම් කර ගෙවීමේ පදනම මත ගෙවිය යුතු බැවින් භූ විද්‍යා සමීක්ෂණ හා අත්හදා බැලීම්වලට අදාලව ගෙවීම් කර ඇති බව.	වැඩ අවසන් කිරීමට කටයුතු සිදු කළ යුතුය

(ඊ)	විශ්වවිද්‍යාලය විසින් නියමිත දිනට විදුලිය හා ජල බිල්පත් පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එකතුව රු.2,418,820 ක දඩ මුදල් ගෙවීමට සිදුවී තිබූ අතර ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විශ්වවිද්‍යාල අරමුදලට සිදුවූ පාඩුව අය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ගිල්පත් සඳහා ප්‍රමාද ගාස්තු අය නොවන ලෙස ගෙවීම් කඩිනමින් කිරීමට කටයුතු කර ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු යුතු කළ යුතුය

3.2 **අරමුදල් ඌන උපයෝජනය**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යාපෘතිය 2015 ජූලි 01 සිට 2016 ජූලි 30 දක්වා කාලය තුළ සම්පූර්ණ කිරීම සඳහා ලැබී තිබුණු රු.1,466,529 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 08 ක කාලයක් ගතවී තිබියදීත් අදාල කාර්යය සඳහා උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි.	පර්යේෂණය ලබාදුන් ජපානයේ APN ආයතනය වෙත අදාල මුදල යැවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව	අරමුදල් නිසිපරිදි උපයෝජනය කළ යුතුය.
(ආ)	පර්යේෂණ අරමුදල් 05 කට අදාල රු.7,309,383ක්, විවිධ අරමුදල් 06 කට අදාළ රු.4,357,557ක්, වෙනත් අරමුදල් 08 කට අදාළ රු.7,699,757 ක් වසරක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.	අරමුදල් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට හා විශ්වවිද්‍යාල අරමුදලට හා පීඨ සංවර්ධන අරමුදලට මාරු කිරීමට නියමිත බව.	අරමුදල් නිසිපරිදි උපයෝජනය කළ යුතුය.

3.3 **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විශ්ව විද්‍යාලයේ අපජල පද්ධතිය මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියට සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මහනුවර මහනගර සභාව අතර අවබෝධතා ගිවිසුම සකස් කර 2019 ජූලි 08 දින එහි කෙටුම්පත විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබුණු නමුත් 2024 ඔක්තොම්බර් 28 දින වන විට වර්ෂ 05 ක කාලයක් ගත වී තිබුණද එම අවබෝධතා ගිවිසුමට එළඹීමකින් තොරව ජාතික	මැනුම් කර ගෙවීමේ පදනම මත ගෙවිය යුතු බැවින් භූ විද්‍යා සමීක්ෂණ හා අත්හදා බැලීම්වලට අදාලව ගෙවීම් කර ඇති බව.	වැඩ අවසන් කිරීමට කටයුතු සිදු කළ යුතුය.

ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත අවස්ථා 2 කදී රු. 16,850,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. තවද 2019 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ වැඩ 2021 දෙසැම්බර් 31 වන විට නතර කර දමා තිබුණු අතර 2024 ඔක්තෝබර් මස වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 7.8 ක් වැනි ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) යටතේ Construction of proposed extension to the manufacturing and industrial Engineering building of the faculty of Engineering ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම වැට් රහිත රු.මිලියන 127.87 මුදලකට පෞද්ගලික ආයතනයක් සමඟ 2021 පෙබරවාරි 16 වන දින ගිවිසුම්ගතව තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය 2022 අගෝස්තු 15 වන දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සියයට 49ක ප්‍රමාණයක් පමණක් වැඩ අවසන් කර රු.91,051,620ක් ගෙවීම් සිදුකර තිබුණි. විශ්වවිද්‍යාලය විසින් කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට යාමේදී කොන්ත්‍රාත්කරු විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් කාර්ය සාධන බැඳුම්කරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි.	කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාතුව අවසන් කිරීමට තීරණය කර ඇති අතර කාර්යසාධන බැඳුම්කරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර ඇතත් කොන්ත්‍රාත්කරු විසින් මෙයට එරෙහිව වාරන නියෝග ලබා ගෙන ඇති අතර විශ්වවිද්‍යාලයට එරෙහි බේරුම්කරන ක්‍රියාමාර්ගවලට එළඹ ඇත. මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා මේ වන විට අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇති බව.	කාර්යසාධන බැඳුම්කරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර නියමිත කාලය තුළ වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මීවතුර නේවාසිකාගාර පරිශ්‍රයේ ආපනශාලාවක් ඉදිකිරීම සඳහා 2021 ඔක්තෝබර් 01 දින පෞද්ගලික ආයතනයක් සමඟ රු.36,815,177ක ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 සැප්තැම්බර් 30 දින වන විට මෙම කර්මාන්තය නිම කර භාර දිය යුතු වුවත්, 2024 සැප්තැම්බර් 10 විගණන දින වන විටත් ගොඩනැගිල්ලේ අත්තිවාරමේ කටයුතු පමණක් නිමකර තිබුණි. තවද 2022 අගෝස්තු 04 වන දින කොන්ත්‍රාත්කරු විසින්	දෙපාර්ශවයේ එකඟතාව මත මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට එකඟතාවය ලබා ඇති අතර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සඳහා 2025 වසර සඳහා මුදල් වෙන් කරවා ගෙන ඇති අතර ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.	ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් අවසන් කර නියමිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නතර කරන බව විශ්වවිද්‍යාලය වෙත ලිඛිතව දන්වා වැඩ බිමෙන් ඉවත්ව ගොස් තිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2023 ජූනි 15 දින සිට ක්‍රියාත්මකවන ලෙස දෙපාර්ශවයේ එකඟත්වය මත ගිවිසුම අවසන් කිරීමට 2024 අගෝස්තු 25 දින පැවති විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. තවද මෙම ව්‍යාපෘතියට අදාළ වූ රු.1,840,800 ක කාර්යසාධන ඇපකරය 2024 ජූලි 13 වන දින අවසන් වීමට පෙර මුදල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ වන විට මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සඳහා අදාළ ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු කරමින් පවතී.